**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2021**

-------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියාමන සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියාමන සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියාමන සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියාමන සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියාමන සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියාමන සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියාමන සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියාමන සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරි වර්ෂය තුළ නිරවුල් කිරීමට වගකීමක් නොමැති රු.1,528,065 ක්වූ පාරිතෝෂික වෙන්කිරීම් ජංගම නොවන වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | සිදුවී තිබුණු දෝෂය 2022 වර්ෂයේදී නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | සේවක පාරිතෝෂික ප්‍රතිපාදනය ජංගම නොවන වගකීම් යටතේ හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ජංගම වත්කම්වල රු.37,762,369 ක ඍණ ශේෂයක් පැවති බැවින් නියාමන සභාවේ කෙටිකාලීන ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේම 2017 වර්ෂයේ සිට නියාමන සභාව අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.33,719,154 ක සමුච්චිත අරමුදල 2021 දෙසැම්බර් 31 දින වන විට රු.14,331,656 ක් දක්වා සියයට 57 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණි. | පසුගිය වර්ෂයන්හි වියදම් සම්පූර්ණ වශයෙන් විශ්ලේෂණය කර කපා ඉවත් කළ හැකි සියලු වියදම් කපා හැර ඇති බව, පෞද්ගලික රෝහල්වල හෙදියන් පුහුණු කිරීමේ වැඩ සටහන් සඳහා වැයකිරීමට අපේක්ෂිත සියලු වියදම්, අයදුම් කරන හෙදියන්ගෙන් හෝ අදාළ රෝහල් වෙතින්ම සපුරා ගැනීමට සැලසුම් කර ඇති බව, ආදායම වැඩිකර ගැනීම සඳහා ලියාපදිංචි වෛද්‍ය ආයතන ප්‍රමාණය වැඩිකිරීමටද මේ වන විට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව හා | රට තුළ ක්‍රියාත්මක සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කර ආදායම වැඩි කර ගැනීමටත් ආයතනයේ වියදම් අවම කර ගැනීමටත් කටයුතු කරමින් කෙටිකාලීන ද්‍රවශීලතාවයෙන් මිදීමටත් අඛණ්ඩව අලාභ ලැබීම අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

එමගින් ඉදිරියේදී සභාව අලාභ ලැබීම අවම කොට ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීමට අපේක්ෂා කරන බව.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අරමුදල් මාරු ගිණුම | රු.232,400 | උපලේඛන | අරමුදල් මාරු කිරීමේ ගිණුමේ (Fund Transfer Account) පැවති මෙතෙක් හදුනාගත නොහැකි වූ මෙම දෝෂය පිළිබඳව, මාසික සභාව වෙත ඉදිරිපත් කොට සාකච්ඡා කළ බව හා මේ පිළිබඳව අපගේ ඊලග මාසික සභාව වෙත නැවත ඉදිරිපත් කොට සභාවේ උපදෙස් පරිදි අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මෙම ශේෂය සඳහා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාමන සභාව විසින් එකතු කරන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් එක් එක් පළාත් සභාව වෙත යවනු ලැබිය යුතුය. නමුත් නියාමන සභාව විසින් ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභා අරමුදලට බැර කිරීම පිණිස පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ප්‍රේෂණය නොකර ඒ වෙනුවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත ප්‍රේෂණය කර තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත ප්‍රේෂණය කර තිබුණු රු.4,527,835 ක් අදාළ පළාත් සභාවල පළාත් සභා අරමුදලට බැරවී නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එපරිදි ප්‍රේෂණය කර නොතිබුණු මුදල රු.41,880,735 ක් විය. | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3 (5) උප වගන්තිය අනුව සහ 2007.3.22 දිනැති 1489/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තුවලින් සියයට 50 ක් අදාළ පළාත් සභා වෙත 2011 වර්ෂය වන තෙක් ගෙවූ බව, 2011 පෙබරවාරි 11 දින සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවෙහි සාමාජිකයන් සමඟ පැවති රැස්වීමකදී ගන්නා ලද තීරණය පරිදි , පළාත් සභාවලට සියයට 50 ක් වෙනම ගිණුමක් ඇතිවිට පමණක් යැවිය යුතු බවට වූ තීරණය නැවතත් සම්මත කළ බව හා වසර මුලදී වාර්ෂික සැලැස්මක් ඉදිරිපත් කළ පසුව සභාවෙහි අනුමැතියෙන් පසු පමණක් මුදල් ගෙවීම් සිදුකළ යුතු බවට තීරණය කර ඇති බව. | මේ සම්බන්ධයෙන් පනතේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.46,934,271 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂ 13 කදී විගණන වාර්තාවලින් මෙම තත්ත්වය හෙළිදරව් කළ නමුත් අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්යාල කළමනාකරණ කමිටුව සහ මාසික සමුළුවේදී සාකච්ඡා කර සභාවේ පූර්ණ අනුමැතිය ඇතිව ආයෝජනය සිදුකළ බව හා 2006 අංක 21 දරණ පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මගින් වෙනම ගිණුමක් පවත්වා ගෙන යාමට බලතල සභාවට ලැබී ඇති බැවින් එම බලතල ප්‍රකාරව ස්ථාවර තැන්පතු ගිණුමක් පවත්වා ගෙන යන බව. | මුදල් පනතේ 11 වන වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 3.8 හා 3.14 වගන්ති | උත්සව අත්තිකාරම් හා බැංකු මගින් ලබාදෙන ණය හැර සෑම ණය මුදලක් වෙනුවෙන්ම සියයට 4.2 බැගින් පොලියක් මාස්පතා අය කළ යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී සේවකයින් 09 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.2,446,666 ක සේවක ණය වෙනුවෙන් සහ 2021 වර්ෂයේදී නිකුත් කර තිබුණු රු.1,881,833 ක ණය වෙනුවෙන් 2021 මැයි මාසය වන තෙක් පොලී අයකර නොතිබුණු අතර 2021 මැයි මාසයේදී නිලධාරින් 04 දෙනෙකුගෙන් පමණක් පොලී අය කර තිබුණි. තවද ණය දීමට පෙර 272 වැනි පොදු ආකෘති පත්‍රවල ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, එපරිදි ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | 2018-2020 කාලය තුළ සේවක ණය සඳහා පොලී අයකර නැති බව, 2021 වර්ෂයේ සිට සේවක ණය සඳහා සියයට 4.2 ක පොලියක් අයකළ බව හා ණය දීමට පෙර විධිමත් ගිවිසුමක් අත්සන් කර ගැනීමට කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් 2021 වසර අවසානයේදී පවත්වා ඒ පිළිබඳව තොරතුරු ඔබ වෙත | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | | ඉදිරිපත් කළ බව. | යුතුය. |
| (ඇ) | 2007 මාර්තු 09 දිනැති අංක 133 (1) දරන අයවැය චක්‍රලේඛය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරියෙකු වෙත ලබා දිය යුතු උපරිම ණය සීමාව රු.250,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 04 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.1,881,833 ක ණය මුදලක් නිකුත්කර තිබුණි. | ආපදා ණය උපරිම සීමාව රු.250,000 ක් වුවද, සභාවේ පූර්ණ අනුමැතිය ඇතිව නියාමන සභාව විසින් මූලික වැටුප මෙන් දස ගුණයක පෞද්ගලික ණයක් ලබාදෙන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී/03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී/03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා එක් අයෙකුට රු.3,000 බැගින් ප්‍රසාද දීමනා ගෙවිය හැකි වුවද, ඒ වෙනුවට එක් අයෙකුට රු.13,500 බැගින් නිලධාරීන් හා සේවකයින් 11 දෙනෙකු වෙත ප්‍රසාද දීමනා ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවා තිබුණු මුදල රු.115,500 ක් විය. | රාජ්‍ය අංශයේ සේවකයින් වෙනුවෙන් බල පැවැත්වෙන චක්‍රලේඛ PED 03 /2020 ප්‍රකාරව හා සභාවේ අනුමැතිය සහිතව සේවක කාර්ය සාධනය සලකා බලා ප්‍රසාද දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් රාජ්‍ය නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු බැවින් 2020 ජූලි 24 දින රු.57,240 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු නමුත් එය 2022 අප්‍රේල් 20 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හමුවේ අප ආයතනය තුළ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය භාවිතා නොකිරීමට කටයුතු කළ බව හා එම තත්ත්වය පහව ගිය පසු ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය භාවිතා කිරීමට බලාපොරොත්තු වන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මාර්ගෝපදේශ | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණු වාර්ෂික අයවැයෙහි පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති | සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය වාර්තාව නියමිත දිනට ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ 5.2.5 ඡේදය | වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ අයවැය වර්ෂය අවසන්වීමෙන් පසුව 2022 පෙබරවාරි 26 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඌ) | 2021 ජුනි 15 දිනැති අංක 21/Misc (032) දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා 2021 ජුනි 16 දිනැති අංක MH/Add/Sec/Admin1 /16/2021 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | 2021 ජුනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා වූ මාස 03 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් සෞඛ්‍ය සේවයේ නියුතු කාර්යමණ්ඩලය වෙත මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.7,500 ක් බැගින් වූ විශේෂිත මාසික දීමනාව, නියාමන සභාවේ කාර්යමණ්ඩලය වෙත ගෙවීමට අනුමැතිය ලබාදී නොතිබුණු නමුත් එම විශේෂිත මාසික දීමනාව නියාමන සභාවේ කාර්යමණ්ඩලය වෙත ගෙවීම සඳහා රු.225,000 ක් වැය කර තිබුණි. | රාජ්‍ය අංශයේ සේවකයින් වෙනුවෙන් බල පවත්වන අංක PED 03 /2020 චක්‍රලේඛය ප්‍රකාරව හා සභාවේ අනුමැතිය පරිදි අප ආයතනයද සෞඛ්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ පවතින ආයතනයක් බැවින්, 2021 වර්ෂයේ ජුනි මස සිට අගෝස්තු මස දක්වා වූ මාස 3 ක කාලසීමාව දක්වා සෞඛ්‍ය සේවක කාර්ය මණ්ඩලයට ගෙවන ලද මසකට රු.7,500 ක් වූ මෙම දීමනාව නියාමන සභාවේ සේවකයින් සඳහාද ගෙවා ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඊට අනුකූල නොවන පරිදි සිදුකළ ගෙවීම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |
| (එ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය | නියාමන සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂ 3 සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ කමිටුව සහ මාසික කමිටු අනුමැතිය ඇතිව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.692,194 පාඩුවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු.6,048,680ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,356,486 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන වියදම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව පළාත් 09 තුළ 2021 දෙසැම්බර් 31 දින වන විට පෞද්ගලික වෛද්‍ය ආයතන 2,011 ක් ස්ථාපිත කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,194 ක් පමණක් විය. | සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන සැලැස්මක් අප සභාවේ අනු දැනුම සහිතව පිළියෙළ කර ඇති බව, 2020 හා 2021 වර්ෂවල පැවති කොවිඩ් වෛරසය හේතුවෙන් බොහොමයක් වෛද්‍ය ආයතන වසා දමා තිබුණු බව හා වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම අඩුවී ඇති බැවින් 2021 වර්ෂයේදී ලියාපදිංචිය අඩුවී ආදායම අඩුවී ඇති බව. | දිවයින පුරා ස්ථාපිත සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීමට හා අධීක්ෂණය කිරීමට, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීමට හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට සහ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට හා කාර්යයන් ඉටුකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත්වී තිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදි හා ලියාපදිංචිය වාර්ෂිකව යාවත්කාලින කිරීමේදි එම ආයතන ඒ ඒ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ සුදුසුකම් ලත් නිලධාරි මණ්ඩලයක් විසින් අධීක්ෂණය කරන බව හා ඉන් අනතුරුව එම ලියාපදිංචිය සඳහා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව වෙත යොමු කරන බව. | පනතේ 9 වගන්තිය ප්‍රකාරව කටයුතු නිමකර ගැනීමට අපොහොසත්වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අදාළ මාර්ගෝපදේශ රෙගුලාසි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | යථෝක්ත පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි | ප්‍රතීතනය යටතේ පෞද්ගලික රෝහල් ශ්‍රේණි ගත කිරීම මේ වන විටත් ආරම්භ කර ඇති බව හා නියාමන සභාව ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙළ කිරීම, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම හා ඒවා රෙගුලාසි බවට පත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශය | පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතනය සඳහා යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | |
| (ඇ) | යථෝක්ත පනතේ පනතේ 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව මහජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි තම ආයතන මට්ටමින් හා නියාමන සභාව මගින් පරීක්ෂා කිරීමට නිසි මාර්ගෝපදේශයක් පිළියෙල කර එම මාර්ගෝපදේශයන්ට අනුකූලව සභාවේ අනුමැතිය සහිතව මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කරන බව. | පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියාමන සභාව විසින් එකතු කරනු ලබන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට පනහක් පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ලබාදීමට ප්‍රථම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සමඟ වාර්ෂික යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට හා වර්ෂය අවසානයට වියදම් හා ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට වූ විධිවිධාන ඇතුළත් කරමින් 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට 2015 ජූලි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද පනත සංශෝධනය කර නොතිබුණි. | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 3(5) වන වගන්තිය ප්‍රකාරව, පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු සභාවේ අනුමැතිය සහිතව අමාත්‍යාංශයේ නීති අංශය හරහා සිදු කෙරෙමින් පවතින බව හා ඒ අනුව දැනට ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 අදාළ පළාතේ සභාව සඳහා ගෙවීම් සිදු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | යථෝක්ත පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් නියාමන සභාව විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | තවද 2020 හා 2021 වර්ෂවලදී අපගේ දත්ත පද්ධතියට අනුව ලියාපදිංචි නොවූ ආයතන පළාත් මට්ටමින් වෙන්කර, ඒවා පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීම සඳහා අදාල පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන් වෙත උපදෙස් ලබාදීමට කටයුතු කර ඇති බව දන්වමි. ලියාපදිංචිය නොලබා පවත්වා | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගෙන යනු ලබන පෞද්ගලික වෛද්‍ය ආයතනයන් හඳුනා ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා මෙන් අදාල පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත මේ වන විටත් සභාව උපදෙස් ලබා දී ඇති බව දන්වමි.තවද ඒ සම්බන්ධව නීතිමය කටයුතු සිදු කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා යන වියදම් ලබාදීමටද නියාමන සභාව කටයුතු කරන බවද දැනුම් දී ඇති බව. | |
| (ඇ) | යථෝක්ත පනතේ 6(1) වගන්තිය යටතේ පත්කරන ලද පාලක මණ්ඩලයට අමතරව සමාජිකයින් 09 දෙනෙකුගෙන් යුතු කාර්යාල කළමනාකරණ කමිටුවක් පත් කර තිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව එක් රැස්වීම් වාරයක් සඳහා එක් අයෙකුට රු.5,000 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු.105,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | සභාවේ සාමාජිකයන් වෙත මාසික සමුළුව ඇතුළුව අනු කමිටුවලට සහභාගිවීමේදී පැමිණීමේ දීමනාවක් ගෙවනු ලබන බව හා එම සියලු ගෙවීම් සභාවේ අනුමැතිය සහිතව ගෙවීමට කටයුතු කර ඇති බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඊට අනුකූල නොවන පරිදි සිදුකරණ ලද ගෙවීම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවල වියදම් දැරීමට කිසිදු විධිවිධානයක් පනතේ සලසා නොතිබුණු නමුත් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ගේ දුරකථන දීමනා, ප්‍රවාහන වියදම් සහ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,329,835 ක් නියාමන සභාව විසින් ගෙවා තිබුණි. යථෝක්ත පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු ආදායමෙන් එම මුදල අඩු කරගෙන තිබුණි. | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට අනුයුක්තව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති වෛද්‍යවරිය බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිර්දේශය මත හා නියාමන සභා අනුමැතිය ඇතිව පත්කර ඇති බව හා එම වෛද්‍යවරියට අදාළ වැටුප්, ප්‍රවාහන වියදම් , දුරකථන ගාස්තු හා අදාළ ගෙවීම් ගෙවීම් සිදු කරනු ලබන්නේ එම පළාත් සභාවට ගෙවීමට නියමිතව ඇති සියයට 50 ක මුදලින් බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නියාමන සභාව යටතේ ලියාපදිංචි කරන පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලියාපදිංචිය ප්‍රදර්ශනය කරමින් නාම පුවරු ගැසීම නියාමන සභාවේ කාර්යයක් නොවූවද, 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 11 කදී, අළුත් නාමපුවරු සකස් කිරීම හා පැරණි නාම පුවරු නැවත සැකසීම (Refill) සඳහා නියාමන සභාව විසින් රු.17,085,102 ක් වැය කර තිබුණි. | අප ආයතනය විසින් සිදු කරන ලද සියලු මිලදී ගැනීම් නිසි ක්‍රමවේදයකට අනුව සිදු කර ඇති බව, එසේම මේ වන විට භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් දැන්වීම් පළකර සැපයුම්කරුවන් ලියාපදිංචිය ආරම්භකර ඇති බව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට යටත්ව විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විටත් ආරම්භ කර ඇති අතර ඒ අනුව කටයුතු කරන බව. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | -------------------------------- | ------------ |
| නියාමන සභාව ආරම්භ කළ වර්ෂයේ සිටම සභාව සතු කාර්යභාරය හා එහි ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ආරම්භයේ සිට නිලධාරීන් දෙදෙනෙකු පමණක් නියුතු ආයතනය විධිමත්ව පවත්වා ගෙන යාමට වරින් වර නිසි ක්‍රමවේදයකට අනුව සේවකයන් බඳවා ගත් බව හා ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පරිපාටිය (SOR) සකස් කර ඇති නමුත් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් බව. | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා ඒ අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, නියාමන සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | නියාමන සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැති බව, විගණන කටයුතු ජාතික විගණන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සිදුකරන බව හා ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් කළමනාකරණ කමිටු පැවැත්වීමට අපහසු වූ බව හා 2022 වර්ෂයේදී එම තත්වය මගහරවා ගැනීට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය " සම්බන්ධව දැනුවත්වී ඇති බව, ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත්කර ඇති 2019/02/13 වන දින අංක 01-13/2019 චක්‍රලේඛයට අදාළ නියාමන සභාව සම්බන්ධ කාර්යයන් හදුනා ගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරන බව, එසේම මේ වන විටත් ක්ෂය රෝග මර්ධන ඒකකය | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව දැනුවත්වී තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන |

| | | |
|---|---|---|
| අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | සහ ජාතික පිළිකා මර්ධන වැඩසටහන සමඟ එක්ව සිදුකරන වැඩසටහන් වලට අවශ්‍ය සහයෝගය ලබාදෙමින් ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කරන බව හා ඉදිරියටද එවැනි වැඩසටහන් සඳහා සහයෝගය ලබාදීමට කටයුතු කරන බව. | දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |